ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.

VII සභා වාරය පනස් හත්වන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.
දිනය : 2022.11.15.
වේලාව: පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:

01. ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය
20.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා.
22.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:
සියලුම මන්ත්‍රීවරුන් සහභාගී වී ඇත.

නිලධාරි සහභාගීත්වය:

01. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි - එම්.එල්.ටී.කේ.ලක්ෂිත තරිඳු මයා.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ පනස් හත්වන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි, එම්.එල්.ටී.කේ.ලක්ෂිත තරිඳු මහතා, විෂය නිලධාරි ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීන් සහ මාධ්‍යවේදී මහතුන් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2022.10.11. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් 2022.10.11. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම හි,
"ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් 2022.09.13. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර " යන සඳහන

"ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් 2022.09.13. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර " ලෙස ප්‍රකාශ කල බවට සංශෝධනය විය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව 2022.10.11. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන සහිතව යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,

(i). බල ප්‍රදේශයේ සියලු මාර්ග හඳුනාගැනීමෙන් අනතුරුව සිතියම් ගතකර අවසානයේ ගැසට් නිවේදනයකින් මහ ජනතාව වෙත ප්‍රකාශයට පත් කිරීම සඳහා ඊට අදාල මාර්ග මැනුම් කටයුතු මේ දිනවල සිදු කරමින් පවතින අතර, දින 45 ක් වැනි කෙටි කාලයකින් මෙම කටයුතු අවසාන කිරීමටත් සිදු ව ඇත. මෙම වැඩසටහන සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ සහ පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වේ. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව, වැලිගෙපොල ප්‍රාදේශීය සභාව, බලංගොඩ ප්‍රාදේශීය සභාව, බලංගොඩ නගර සභාව යන ආයතන හා සියල්ල එකතු වී මාර්ග මැනුම් කර සිතියම්ගත කිරීමේ කටයුතු සිදු කිරීමේ අරමුණින් පුහුණු වැඩමුළුවක් පවත්වන ලදි. සභාව විසින් මෙම වැඩසටහන ආරම්භ කිරීමේ පුහුණුව සඳහා මොරහැල උඩවෙල මාර්ගය භාවිතා කරන ලදි. ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන මාර්ග තුන වන කොළඹ බදුල්ල මාර්ගය, ඇල්ලේඅරාව පින්නවල මාර්ගය, පඹහින්න සිට කුඹල්ගම කපුගල මාර්ගය යන මාර්ග හා ඒ සෑම ප්‍රධාන මාර්ගයක් හරහා වන අතුරු මාර්ග සියල්ල හා එම මාර්ගයන්හි අන්තර්ගත වීථි පහන්, පාලම්, බෝක්කු, පැති බැම්, ඇළ මාර්ග, විදුලි කණු, පාසල් ඇතුළු රජයේ ආයතන, ආගමික සිද්ධස්ථාන ආදී සියලු අංග විමර්ශනයට ලක් කරමින්, ඒවා ද අදාල මාර්ගයේ සිතියම තුල අන්තර්ගත කරනු ලැබේ. මෙහි ප්‍රථම අදියර ලෙස 2022/11/09 වන දින කොළඹ බදුල්ල ප්‍රධාන මාර්ගයේ සියලු දකුණු පස හා වම් පසට අදාල මාර්ගයන් හඳුනාගත් අතර, මේ අවස්ථාව වනවිට මාර්ග 33 ක තොරතුරු එක්රැස් කිරීමේ කටයුතු අවසන් කර ඇත. බල ප්‍රදේශය තුල පිහිටි

කොට්ඨාසයන්හි මාර්ග මැනුම් කටයුතු සිදුවන අතර වාරයේ දී ඔබතුමන්ලාගේ සහයෝගය ඒ සඳහා ලබා දීමට කාරුණික වන්න.

**(03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.**

**(i).** ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව මඟින් සිදු කල කර්මාන්ත හා සේවාවන් සඳහා ලබා දී ඇති අත්තිකාරම් වශයෙන් **3070431.34** ක මුදලක් අත්තිකරම් ලේඛනයේ වසරින් වසර ශේෂ වී නොපිය වූ අත්තිකාරම් වශයෙන් පවතින බවත්, මේ සඳහා විගණන විමසුම් ගණනාවක් ද පවතින බවත්, කාර්යාලයේ පවතින ලේඛන අනුව මෙම මුදල් එම කාල වකවානුවල පියවී ඇති බවට සාක්ෂි නොමැති බවත්, මෙම අත්තිකාරම් මුදල් පියවා ඇති නමුත් නිසිපරිදි ලේඛන වල ඇතුලත් නොවීම නිසා මෙම අත්තිකාරම් ශේෂ ඉදිරියට රැගෙනවිත් ඇති බවට අනුමාන කල හැකි බවත් දන්වමින් මෙම නොපියවූ අත්තිකාරම් ලෙස සටහන් වී ඇති මුදල් ලේඛන වලින් ඉවත් කිරීමට අදාලව ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
මෙම සිදුවීම්වලට අදාල වන්නේ කුමන සභාපතිවරයාගේ ධූර කාලය ද යන්න දැන ගැනීමට අවශ්‍ය බව ප්‍රකාශ කිරීමත් සමඟ ගරු සභාපතිතුමා විසින් සී/ස බලගොඩ, ඇල්ලේඅරාව, ඉඹුල්පේ වි.සේ.ස සමිතිය වෙතින් සභාවට ඉන්ධන ලබාගැනීමට අත්තිකාරම් මුදල් තැන්පත් කිරිම අදාල ගැටළුව පවතින්නේ හිටපු සභාපති ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමාගේ කාලයේ බව ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
හිටපු සභාපතිතුමා මේ සභාවාරයේ මන්ත්‍රීවරයෙක් ලෙස සභාව නියෝජනය කරන බැවින්, එතුමා සභාගර්භයට පිවිස සිටින අවස්ථාවකදී මේ පිළිබඳව සාකච්ඡා කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
මේ අවස්ථාව වන විට එතුමා සභා ගර්භයට නොපැමිණීම නිසා එතුමා සභා ගර්භයට පැමිණි අවස්ථාවක දී මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මෙම යෝජනාව කල් තැබීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**(ii).** නළුවෙල ග්‍රාම නිලධාරි වසම ඇතුළු ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරි වසම් කිහිපයක ඉඩම්වල නෛතික වලංගුභාවය පිළිබඳව පවතින ගැටළුව විසඳා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය අදහස් දක්වමින්,
නව නීතියක් හේතුවෙන්, ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ග්‍රාමසේවා වසම් කිහිපයක ඉඩම්වල නෛතික භාවය පිළිබඳව ගැටළු මතුවෙලා. එම ඉඩම්වල වසර කිහිපයක පත්ඉරු සොයා බැලුවත්, එම ඉඩම් දේවාලයට අයිති බවට කිසිම සඳහනක් හෝ මූලාශ්‍ර දක්නට ලැබුණේ නැහැ. මෙම ඉඩම් දේවාලයට අයත් නම් මෙපමණ කාලයක් ඉඩම් හිමිකරුවන් දේවාලයට රාජකාරි ඉටු නොකිරීම වරදක්. ඉඩම්වල සින්නක්කර අයිතිය පිළිබඳව ගැටළු සහගත වුවත්, ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් දේවාලයට මෙම ඉඩම් අයත් වන බව නිරීක්ෂණය වේ ලෙස සඳහන් වූ ලිපියක් යොමු කර තිබුණා. බොහෝ දෙනෙක් නිවාස තනා ගැනීමටත්, නැවත ආයෝජනය කිරීමට ඉඩම් මිලදීගෙන ඇතත්, නිවාස ඉදි කිරීමේ දී ඒ සඳහා බැංකු ණය ලබා ගැනීමට නොහැකි වී ඇති බැවින්, මේ පිළිබඳව සොයා බලා සාධාරණය ඉටු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් එම ඉඩම් කොටස් උග්ගල් අලුත් නුවර දේවාලයට අයත් බව නිරීක්ෂණය වේ ලෙසට ලිපියක් නිකුත් කර තිබීමත්, ගම්වාසීන්ගේ ඉල්ලීමත් සැලකිල්ලට ගෙන මේ සම්බන්ධව සාකච්ඡා කිරිමට දේවාල නිලධාරීන් කැඳවීමටත්, එහිදී රාජකාරි කටයතු හා සම්බන්ධ වන ඉඩම් පිළිබඳවත්, රාජකාරී කටයුතු හා සම්බන්ධ නොවන ඉඩම් පිළිබඳව හඳුනාගැනීමෙන් අනතුරුව, මේ

සම්බන්ධව වැඩි දුරට සාකච්ඡා කර විසඳුමක් ලබා ගැනීම සඳහා ඉඹුල්පේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

**(iii).** ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැගපිටිය ග්‍රාම නිලධාරි වසමේ රයිවත්ත නොම්මර 13 ගම්මානයේ අනවසර ආගමික ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් බලංගොඩ ඇල්ලේඅරාව, ශ්‍රී බෝධිතිලකාරාමයේ පූජ්‍ය තවලම්පොල අමරවංස හිමි සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපි ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
කතෝලික සභාවට අයත් අනවසර ආගමික ගොඩනැගිල්ලක් ඉදි කරන බවට ගම්වාසීන් විසින් සති කීපයක සිට චෝදනා එල්ල කිරිම හේතුවෙන්, දැනට කුඩා ශාලාවක් ලෙස ඉදිකරමින් පවතින එම ස්ථානය කොට්ඨාසය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරයා ලෙස නිරීක්ෂණය කළා. මෙය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වන අතර සමනලවැව ජලාශය ඉදිකිරීමේ දී ඉඩම් අහිමි වූවන්ට වන්දි ලෙස ඉඩම් පිරිනමන අවස්ථාවේ දී ඉතිරි වූ ඉඩම් කොටසකි. වර්තමානය වන විට ෆැන්සිස් තංගරාජා නැමැත්තෙක් මෙහි අයිතිකරු බව ප්‍රකාශ කරන අතර, අනවසරෙන් මෙම ඉදිකිරීම සිදුවෙනවා. දික්ඔය, හැටන් ප්‍රදේශයේ සේවියස් ජේ.එස්. ජේසුස් වහන්සේගේ භාස්කම් සේවය නැමැති සංවිධානයෙන් ඉදිකිරීම් කටයුතු සිදු කරනවා. වතුකරයේ අහිංසක දමිළ ජනතාව ආගමට හරවා ගන්නා බවට විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලාත්, අසල්වාසීනුත් විරෝධතා ප්‍රකාශ කරනවා. රයිවතුයායට අයත් ඉඩම් සම්බන්ධව නඩු කටයුත්තක් පවතින බැවින් මෙම ඉඩම් සඳහා කිසිවෙකුට අයිතිවාසිකම් කියන්න බැහැ. මේ පිළිබඳව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිතුමා දැනුවත් කිරීම සඳහා තොරතුරු ලබා දී නැහැ. ඉඩම මිලදී ගත් පුද්ගලයා ද මේ වන විට ප්‍රදේශයේ පදිංචි කරුවෙකු නොවේ. අනවසර ඉඩම් කොටසක අනවසර ඉදිකිරීමක් බැවින් අනාගතයේ දී විශාල අර්බුධයකට මුහුණ දීමට පෙර මේ සඳහා ගතයුතු නිත්‍යානුකූල පියවර ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1942 හා 2015/11/20 දිනැති ගැසට් පත්‍රය අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සිදු කරන සියලු ඉදිකිරීම් සඳහා නිසි පරිදි ගොඩනැගිලි සැළසුම් ප්‍රාදේශීය සභාව වෙත අනිවාරයෙන්ම ඉදිරිපත් කල යුතු අතර, එම සැළසුම් අනුමත කිරීමෙන් පසුව පමණක් ඉදිකිරීම් කටයුතු සිදුකල යුතු වේ. ඒ අනුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව අනවසර ඉදිකිරීම් නැවැත්වීමට හැකි බැවින් මෙම අනවසර ඉදිකිරීම නතර කිරිමට කටයුතු කරනවා. කුමන ආගමකට අයත් වුවද ආගමික සිද්ධස්ථාන ඉදි කිරීමේ දී ඒ සඳහා පවතින නිත්‍යානුකූල ක්‍රමවේදය අනුගමනය කල යුතු බැවින්, සුදුසු ක්‍රමවේදය අනුගමනය කරන ලෙසත් දන්වා යැවීමට කටයුතු කර ඇති අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ, 3 වන පරිච්ඡේදයේ, මූලික අයිතිවාසිකම්, 3.10 වගන්තිය යටතේ ආගමික නිදහසට හිමිකම් ලබා ඇති බැවින්, ආගමට බඳවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට මැදිහත් වී ක්‍රියා කිරීමට හැකියාවක් නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
ආගමික සිද්ධස්ථාන ඉදිකිරීමේ දී ඒ සම්බන්ධයෙන් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ වෙතින් අවසර ලබා ගැනීමට කටයුතු කල යුතු බව ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
බල ප්‍රදේශය තුල ආගමික සිද්ධස්ථානයක් ඉදිකිරීම් කටයුතු වලදී ප්‍රාදේශීය ලේකම් වෙතින් හා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙතින් අවශ්‍ය නිත්‍යානුකූල අවසරය ලබා ගැනීමට ඉල්ලුම් කිරීමෙන් අනතුරුව, අවසරය ලබා දීම සඳහා ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත දන්වා යැවීමට පළාත් පාලන ආයතනය විසින් කටයුතු කල යුතු වුවත් ඒ සඳහා ඉල්ලීම් කර නැහැ. මෙම ඉඩම මිලදී ගත් පුද්ගලයා මේ ප්‍රදේශය හැර ගියත්, අනවසර ඉදිකිරිම පිළිබඳව පරික්ෂා කල හැකි අතර, ගොඩනැගිලි සැළසුම අනුමත කරවා නොගැනීම හේතුවෙන් අනවසර ඉදිකිරීම නවතා දැමීමට කටයුතු කරනවා.

**(iv).** පන්දෙනිය ප්‍රජා ජල ව්‍යාපෘතියේ බෙදා හැරීමේ නල පද්ධතිය සිදු කිරිම සඳහා ඇස්තමේන්තු සකස් කලද පවත්නා සීමිත ප්‍රතිපාදන මත මෙම වර්ෂය තුල මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කල නොහැකි බැවින්, මෙම ජල ව්‍යාපෘතිය **2023** වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඉතිරි වැඩකටයුතු අවසන් කිරීමෙන් අනතුරුව ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලබා දීමට අපේක්ෂා කරන බවට දන්වමින් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
මා නියෝජනය කරනු ලබන කොට්ඨාසයේ සංවර්ධනය කරවා ගැනීමට නියමිත ප්‍රජා ජල ව්‍යාපෘතිය බැවින් මේ සම්බන්ධයෙන් එවන ලද ලිපියේ පිටපතක් මා වෙත ලබා දෙන්න.

ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
අදාල ලිපියේ පිටපතක් ලේකම්තුමිය මඟින් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නවා.

## (04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

සභාවට අයත් ජේ.සී.බී යන්ත්‍රය මඟින් **2022** වර්ෂයේ ඔක්තොම්බර් මස දක්වා අයකරගෙන ඇති ආදායම කොපමණදැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා විසින් පසුගිය සභාවාරයේ දී යෝජනාවක් ඉදිරිපත් කල අතර එම යෝජනාවට අදාලව **2022/01/02** දින සිට **2022/09/31** දින දක්වා අයකරගෙන ඇති ආදායම විෂය නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාව මහ සභාවේ දැන ගැනිම සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.
අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
**2022/01/02** දින සිට **2022/09/31** දින දක්වා අයකරගෙන ඇති ආදායම **1,247,550.00** ක් බව ප්‍රකාශ කරන ලදි.

එම වාර්තාවේ පිටපතක් ලබා දෙන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා ඉල්ලා සිටීමත් සමඟ පිටපතක් ලේකම්තුමිය මඟින් ලබා දීමට පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

මෙම අවස්ථාව වන විට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා සභා ගර්භයට පිවිසීම හේතුවෙන් නොපිය වූ අත්තිකාරම් ලේඛනය පිළිබඳ සාකච්ඡා කිරීමේ යෝජනාව කල්තබා තිබූ බැවින්, න්‍යාය පත්‍රයෙන් ඔබ්බට ගොස් නැවත එම යෝජනාව සාකච්ඡා කිරීම සඳහා සභාගත කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සභා ගර්භයේ රැඳී සිටින අවස්ථාවක දී මේ පිළිබඳව සාකච්ඡා කරන ලෙසට අනෙකුත් මන්ත්‍රීවරුන් ඉල්ලීමක් කළ බැවින්, මීට පෙර න්‍යායපත්‍රානුකූලව ඉදිරිපත් කරන ලද යෝජනාව කල් තැබීමට කටයුතු කල අතර, නැවත එම යෝජනාව සාකච්ඡාවට ඉදිරිපත් කරනවා. ඔබතුමා සභාපති ධූරය දරන කාලයේ දී ඇල්ලේඅරාව වි.සේ.ස.ස. ඉන්ධන පිරවුම්හල වෙත සභාවට ඉන්ධන ලබාගැනීම සඳහා තැන්පත් කරන ලද අත්තිකාරම් මුදල නොපිය වූ අත්තිකාරම් ලේඛනයේ සටහන් ව ඇති අතර, මෙම ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබානොගෙන එච්.එල්.ඩබ්. ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබාගැනීම සඳහා මාරු වී ඇතත් තැන්පත් කරන ලද මුදල් ලබා නොගැනීම නිසා මෙම ගැටළුව ඇති වී ඇති බවත්, මේ පිළිබඳව විෂය නිලධාරි හා ලේකම්තුමිය විසින් එම ඉන්ධන පිරවුම්හලෙන් විමසුම් කල අවස්ථාවේ දී රු. **75000.00** ක මුදලින් සභාවට රු. **18096.22** ක මුදලක් ගෙවීමට ඇති බව දන්වා එවා තිබෙනවා. ඉන්ධන පිරවුම්හල් මාරු කිරීමෙන් පසුව මෙම අත්තිකාරම් මුදලින් ඉන්ධන ලබා ගත්තේ කවුරුන් ද යන්න ගැටළුවක්. විගණන විමසුම් හේතුවෙන් මෙම අත්තිකාරම් මුදල හැර අනෙකුත් අත්තිකාරම් මුදල් කපා හැරීම සඳහා සභා අනුමැතියෙන් පසුව සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාට ඉදිරිපත් කල යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා අදහස් දක්වමින්,
රත්මලවින්න විදුහලේ චන්ද්‍රසිරි මහතා විදුහල්පතිව සිටි කාලයේ, රත්මලවින්න විදුහලේ ක්‍රීඩාපිටිය සකස් කිරීමේදී එහි පැවැති විශාල කබොක් ගල් ඉවත් කිරීමට පැවැති යන්ත්‍ර ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මාගේ ලිඛිත ඉල්ලීම පරිදි, වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී, අකිල සාලිය එල්ලාවල මැතිතුමා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ උප සභාපතිවරයාව සිටි කාලයේ 320 වර්ගයේ යන්ත්‍රයක් ලබා දුන්නා. මේ සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝන් සෙනෙවිරත්න මැතිතුමා වාචිකව උපදෙස් ලබා දුන්නා. එවකට මහ ඇමැති ලෙස කටයුතු කල මහීපාල හේරත් මැතිතුමා මේ සඳහා ඉන්ධන සපයන බව ප්‍රකාශ කලත් ඉන්ධන ලබාදෙන තුරු සභා අරමුදලින් ඉන්ධන සපයා මෙම කර්තව්‍ය කිරීමට උපදෙස් ලබා දුන්නා. ලැබුණු උපදෙස් හා එම විශ්වාසය මත රත්මලවින්න විදුහලේ ක්‍රීඩාපිටිය සහ සභාවට අයත් රත්මලවින්න ක්‍රීඩාපිටිය සකස් කළා. සභා අරමුදලින් ඉන්ධන ලබා දුන් බැවින් මීට අදාල ලේඛන බලන්න, බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලය විසින් මීට අදාල බිලපත නිකුත් කළා. මේ සඳහා දෙලක්ෂ හැත්තෑපන්දහසකට අධික මුදලක් වැය වූ අතර, හිටපු විදුහල්පතිතුමා සාක්ෂි දරයි ලක්ෂ දෙකක මුදලක් මා අතේ ඇති මුදලින් ගෙව්වා.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
මේ සඳහා වෙනත් අර්ථකතන ඇති විය හැකි බැවින්, ඔබතුමා සිටින අවස්ථාවේ සාකච්ඡා කල යුතු බව මන්ත්‍රීවරුන්ගේ සහ සභාපතිවරයා ලෙස මගෙත් මතය වූ බැවින් මේ අවස්ථාවේ ඉදිරිපත් කළා. නිත්‍යානුකූල ලෙස නොපිය වූ අත්තිකාරම් කපා හැරීම සඳහා තීරණය කළ යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
මේ සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමාගේ ප්‍රකාශය ලිඛිතව ලබාගෙන කපා හැරිමට කටයුතු කිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය අදහස් දක්වමින්,
විශාල බල ප්‍රදේශයක් පාලනය කල පරිණත හා ජ්‍යෙෂ්ඨ සභාපතිවරයෙක් වන හිටපු සභාපතිතුමා ඉන්ධන සැපයීම සම්බන්ධයෙන් පසුකාලීනව හෝ අදාල ලේඛන සකසා තිබිය යුතුයි. එම කාල වකවානුවල සභා වාර්තා හෝ තිබිය හැකිය. ඒවා පරීක්ෂා කර, ඒ අනුව ලිඛිත සාක්ෂි මත නොපිය වූ අත්තිකාරම් කපා හැරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
ලිඛිත සාක්ෂි නොමැතිවීම මෙම කාරණාවට පමණක් ලඝු නොකළ යුතුයි. හේතුව ලංකාවේ බොහෝ රාජ්‍ය ආයතනවල යම් යම් ලිපි ලේඛන සොයා ගැනීමට අපහසුතා පවතිනවා. එහෙත් මාගේ ධූර කාලය තුල නිවැරදිව ලේඛන ආරක්ෂා වන පරිදි කටයුතු කරන්න මම උත්සහ කළ අතර ඒ සඳහා නසිලධාරින්ට උපදෙස් දුන්නා. වජිර දිසානායක මැතිතුමාගේ කාලයේ දී කුලරත්න මැතිතුමාගේ උපදෙස්ම මත රත්මලවින්න දම්පිටිය වැව ප්‍රතිසංස්කරණය කළා. ආණ්ඩුව මාරුවීමත් සමඟ එම ගෙවීම් සිදු වුණේ නැහැ. එහෙත් රත්මලවින්න විදුහලේ විදුහල්පතිතුමාත්, පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා, මහීපාල හේරත් මැතිතුමාන්ලාගෙන් අවශ්‍ය උපදෙස් ලබාගෙන මෙම නොපිය වූ අත්තිකාරම් ලේඛන වලින් කපා හැරිම සඳහා අවශ්‍ය සාක්ෂි හෝ ඉදිරිපත් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා අදහස් දක්වමින්,
මම මේ සභාවට සභාපතිවරයා ලෙස පැමිණෙන අවස්ථාව වන විට මෙහි පැවැති තත්ත්වයත් වත්මන් තත්ත්වයත් බලන්න. මගේ පළපුරුද්ද පිළිබඳව කතා කරන්න ඔබතුමියට අයිතියක් නැහැ. මාස ගණනාවක් මාසික මහ සභාවල මේ පිළිබඳව සාකච්ඡා කළා. මේ පිළිබඳව සභා වාර්තාවල සටහන් වී තිබිය හැකියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය අදහස් දක්වමින්,
මා ඔබතුමාගෙන් ප්‍රශ්න කළා නොවෙයි, එහෙත් නොපිය වූ අත්තිකාරම් පිළිබඳව පිළිතුරු ලබා දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා අදහස් දක්වමින්,

පුවක්ගහවෙල හීරළුවාඹය මාර්ගය නායයාමත් සමඟ අතුරු මාර්ගයක් හදන්න උපදෙස් ලැබුණා. යම් යම් අවස්ථාවන්වලදී ක්ෂණිකව හා කාලීනව උද්ගත වූ ප්‍රශ්නවලදී ගැලපෙන පරිදි කටයුතු කරන්න සිදු වුණා.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
මෙය වසර 10 කට පෙර සිදුවීමක්. මේ සම්බන්ධයෙන් ලිඛිත කුමන හෝ සාක්ෂියක් ඇත්නම් ඉදිරිපත් කරන්න. ඔබතුමා සිටින අවස්ථාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය අදහස් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් එතුමියට මා ස්තූතිය පල කරනවා.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා අදහස් දක්වමින්,
නොපිය වූ අත්තිකාරම් ලේඛනයේ මෙම සිද්ධිය සාකච්ඡා කිරීමට හිටපු සභාපතිතුමා සිටියත්, එම ලේඛනයේ සටහන්ව ඇති අනෙකුත් කාරණා සම්බන්ධයෙන් පිළිතුරු සපයා ගැනීමට ක්‍රමවේදයක් නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
මීට පෙර අවස්ථාවන්වලදී කපාහැරීම්වලට යෝජනා අනුමත කර කපා හැර තිබෙනවා. සභා වාර්තාව උසාවිය පවා පිළිගන්නා නිසා හිටපු සභාපතිතුමාගේ ප්‍රකාශය ප්‍රමාණවත් බැවින් ලිඛිත සාක්ෂි අවශ්‍ය නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
කාර්යාලයක ලිපිගොණුවල වගකීම නිලධාරින් සතුයි. ඔබතුමාට හෝ මට ගෙදර රැගෙන යා නොහැකියි. ලිපිගොණු අස්ථානගත වීම ගැටළුවක් බැවින්, හිටපු නිලධාරීන් එහි සම්පූර්ණ වගකීම දරන්න අවශ්‍යයි. සාධාරණ හේතු ඉදිරිපත් කර කපා හැරීම සඳහා ආණ්ඩුකාරතුමාට යොමු කරමු.

නොපියවූ අත්තිකාරම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් විය.
එම සාකච්ඡාවෙන් අනතුරුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමාගේ සහ ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා ලිඛිත සාක්ෂි සතියක් ඇතුළත ලබා දෙන බවත්, එමඟින් එයට සම්බන්ධ ආයතන වෙතින් තොරතුරු ලබා ගැනීමටත්, එම තොරතුරු මත පදනම්ව අත්තිකාරම් මුදල් කපා හැරීමේ කටයුතු සිදු කිරීමටත් කාරක සභා අවස්ථාවේ දී තීරණය විය.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා විසින් සතියක් අතුළත ලබාදෙනු ලබන ලිඛිත තොරතුරු සැලකිල්ලට ගෙන එයට සම්බන්ධ ආයතන වෙතින් තොරතුරු ලබාගැනීමෙන් අනතුරුව, එම තොරතුරු මත පදනම්ව නිසි සොයා බැලීමක් සිදු කිරීමටත්, එම තොරතුරු සාධාරණ බව තහවුරු කරගැනීමෙන් පසුව, සභාවට ඉදිරිපත් කර සභාව සෑහීමකට පත්ව අදාල අත්තිකාරම් මුදල් කපා හැරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

## (05). යථා පරිදි කල් දී ඇති යෝජනා.

**(i).** රත්මලවින්න පෙලමල්පිටිය ජල යෝජනා ක්‍රමයේ ජල මෝටරය කාර්මික දෝෂයක් හේතුවෙන් අක්‍රිය තත්ත්වයට පත්ව ඇති බැවින්, එම ජල මෝටරය අලුත්වැඩියා කිරීම සඳහා සුනිල් ගෝවින්නගේ ඉලෙක්ට්‍රිකල් ආයතනය වෙත යොමු කිරීමෙන් අනතුරුව, එහි අලුත්වැඩියා කටයුතු සඳහා රු. 281000.00 ක මුදලක් වැය වන බවත්, නව ජල මෝටරයක් මිලදී ගැනීම සඳහා රු. 758732.00 /- ක මුදලක් වැය වන බව ජිනසේන සමාගම විසින් පිරිවිතර එවා ඇති බවත් සඳහන් කරමින් එම යෝජනාවට අදාලව විෂය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,

ජල මෝටරය අලුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන අතර, එම අලුත්වැඩියා කටයුතු වලින් අනතුරුව, ඉතා කෙටි කලකින් නැවත අලුත්වැඩියා කිරීමට ද සිදු විය හැකි ය. ජනතාවට කඩිනම් ජල සේවාවක් ද සැපයිය යුතු අතර, නව ජල මෝටරයක් මිලදී ගැනීමට අදාල පිරිවිතර ඉදිරිපත් කර ඇති බැවින්, මේ පිළිබඳව ඔබතුමන්ලාගේ සහ ඔබතුමියන්ලාගේ යෝජනා සහ අදහස් අනුව තීරණයක් ගන්නා ලෙසට ප්‍රකාශ කරන ලදි.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවීමෙන් අනතුරුව, නව ජල මෝටරයක් මිලදී ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ර්.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
මිළදී ගැනීමට ජල මෝටරයේ වගකීම් කාලය කොපමණ ද? වගකිව යුතු කාලය නිශ්චිත නොවීමෙන් නොරොච්චෝලේ ගල්අඟුරු බලාගාරය මෙන් වරින් වර අලුත්වැඩියා කිරීමට සිදු විය හැකිය.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
නොරොච්චෝලේ ගල්අඟුරු බලාගාරය සංවර්ධන ව්‍යාපෘතිය නිසා රට තුල උද්ගතව ඇති විදුලි අර්බුදය යම් තරමකින් හෝ විදුලි කප්පාදු කිරීම අඩු කරවා ගැනීමට හැකි බවත්, නැතහොත් මීට වඩා විදුලි කප්පාදුවක් සිදු විය හැකි බව ද ප්‍රකාශ කරන ලදි. එමෙන්ම සාම්පූර් විදුලි බලාගාරය සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට පෙර ලාල්කාන්ත මැතිතුමා එයට විරෝධය ප්‍රකාශ කළා. වගකිව යුතු ආයතනයක් වන ජිනසේන සමාගමෙන් ජල මෝටරය මිළදී ගනු ලැබේ.

ඒ අනුව, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවීමෙන් අනුතුරුව, නව ජල මෝටරයක් මිලදී ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(ii). සභාවට අයත් ගලගම බහුකාර්ය ගොඩනැගිල්ල බඳු ගිවිසගෙන ඇති බඳුකරුගේ බඳු ගිවිසුම් කාලය අවසන් වි ඇති බැවින්, නැවත බඳු ගිවිසුම් කාලය 2023/09/11 වන දින දක්වා දීර්ඝ කර දෙන ලෙසට DEVOC LANKA (PVT) LTD, සිරි ධිති ලංකා පදනම, සභාපති, අනූප ප්‍රේමරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
එම ගොඩනැගිල්ල වෙනත් ඉල්ලුම්කරුවෙක් විසින් ඉල්ලුම් කර නොමැති බැවින්, නැවත වසරක කාලයක් සඳහා එම ඉල්ලුම්කරුටම ලබා දෙන බැවින්, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව ලබා දීමටත්, මුල් වසර සඳහා මාසිකව රු.100000.00 ක මුදලක් අයකල අතර, ඉන්පසුව සෑම වසරක් පාසාම මාසික බඳුකුළිය වූ මුල් අයකිරීමට10% ක් බැගින් එකතු කිරීම සුදුසුයි.

ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව ලබා දීමටත්, මුල් වසර සඳහා මාසිකව රු. 100000.00 ක මුදලක් අයකල බැවින්, ඉදිරියේ දී සෑම වසරක් පාසාම මාසික බඳුකුළිය වූ මුල් අයකිරීමට 10% ක් බැගින් එකතු කිරීමෙන් අනතුරුව, ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව ලබා දීමටත්, මුල් වසර සඳහා මාසිකව රු. 100000.00 ක මුදලක් අයකල අතර, ඉන්පසු සෑම වසරක් පාසාම මාසික බඳුකුළිය වූ මුල් අයකිරීමට 10% ක් බැගින් එකතු කිරීමෙන් අනතුරුව, ලබා දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(iii).** ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් පානීය ජල ව්‍යාපෘති සඳහා නව ජල සබඳතා ලබා දීම සඳහාත්, අක්‍රිය ජල මීටර් සඳහා නැවත ජල මීටර් ස්ථාපිත කිරීම සඳහාත් නව ජල මීටර් සියයක් මිලදී ගන්නා ලෙසට විෂය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
නව ජල මීටර් මිලදී ගැනීමේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිළදී ගැනීමත්, මෙහිදී ඔබතුමන්ලා සහ ඔබතුමියන්ලා දන්නා හඳුනන වෙනත් සමාගම් මඟින් අඩු මිළට උසස් තත්ත්වයේ ජල මීටර් මිළදී ගැනීමට හැකියාවක් ඇත්නම් ඒ බව එම ආයතන මඟින් ඉල්ලුම් කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ නව ජල මීටර් සියයක් මිළදී ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් පානීය ජල ව්‍යාපෘති සඳහා නව ජල සබඳතා ලබා දීම සඳහාත්, අක්‍රිය ජල මීටර් සඳහා නැවත ජල මීටර් ස්ථාපිත කිරීම සඳහාත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ නව ජල මීටර් සියයක් මිළදී ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනා ඒකමතිකව සහා සම්මත විය.

**(iv).** ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව මඟින් ගිණුම්, ආදායම්, ආයතන, සෞඛ්‍ය, සංවර්ධන, මහජන උපයෝගිතා, සුභසාධන අංශයන් හරහා සිදු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් වලින් සමන්විත 2023 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම අනුමත කර දෙන ලෙසට විෂය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

2023 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2023 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**(v).** ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2023 වර්ෂයේ ජනවාරි මාසයේ සිදු කල යුතු බවත්, එහිදී භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සඳහා මහජන නියෝජිතයන් තිදෙනෙකු හා කාර්ය මණ්ඩල නිලධාරින් පත් කල යුතු බවත් සඳහන් කරමින් විෂය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා අදහස් නැවතත් දක්වමින්,
අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සහභාගී වන නිලධාරින්ට සංයුක්ත දීමනාව ලබා ගැනීමට නොහැකි වන අවස්ථාවල්වලදී, අංක 7/3/9/10 හා 2019 අප්‍රේල් මස 22 වන දිනැති ලිපිය මඟින් එක් නිලධාරියෙකුට දිනකට රු. 1000.00 බැගින් දින හතරක උපරිමයකට යටත්ව දීමනාවක් ගෙවිය හැකි බව සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති දන්වා එවා ඇති බැවින්, 2022 වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සහභාගී වන මහජන නියෝජිතවරුන් තිදෙනාටත්, නිලධාරින් ඇතුළු භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයට ගෙවීම් කිරීමට හැකි බව ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා යන මහජන නියෝජිතවරු

තිදෙනාත්, නම්කර ඇති නිලධාරි මණ්ඩලයත් පත් කිරීමත්, ඔවුන්ට අදාල දීමනාව සහා අරමුදලින් ගෙවීමත් සුදුසු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා යන මහජන නියෝජිතවරු තිදෙනාත්, නම්කර ඇති නිලධාරි මණ්ඩලය පත් කිරීමත්, ඔවුන්ට අදාල දීමනාව සහා අරමුදලින් ගෙවීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(vi).** සේවා ගිවිසුම් මත සේවයට බඳවාගත් ආර්.එම්.එම්.ජේ.බණ්ඩාර මයා, එස්.සුදර්ශන් මයා, එස්.ඒ.අයි පුෂ්ප කුමාර මයා, ඒ.ජී.සී.ආර්.මල්ෂාන් මයා, ඒ.බී. නිලන්ත දුල්මිණ මයා, එල්.ආර්.කේ.සී.ආර්.විජේරත්න මයා, එම්.එම්.එන්.පී.ජයසිංහ මයා යන සෞඛ්‍ය කම්කරුවන්ගේ හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන්ගේ බඳවා ගැනීමේ සේවා ගිවිසුම් කාලය අවසන් වී ඇති බැවින් රඳවා ගැනීමේ අවශ්‍යතාවය මත සේවා ගිවිසුම් කාලය ඉදිරි මාස දොළහක කාලයක් සඳහා දීර්ඝ කරවා ගැනීමට අදාලව විෂය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

සේවා ගිවිසුම් මත සේවයට බඳවාගන්නා ලද ආර්.එම්.එම්.ජේ.බණ්ඩාර මයා, එස්.සුදර්ශන් මයා, එස්.ඒ.අයි පුෂ්ප කුමාර මයා, ඒ.ජී.සී.ආර්.මල්ෂාන් මයා, ඒ.බී. නිලන්ත දුල්මිණ මයා, එල්.ආර්.කේ.සී.ආර්.විජේරත්න මයා, එම්.එම්.එන්.පී.ජයසිංහ මයා යන සෞඛ්‍ය කම්කරුවන්ගේ හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන්ගේ සේවා ගිවිසුම් කාලය ඉදිරි මාස 12 ක් සඳහා දීර්ඝ කිරිම සුදුසු බවට ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව සේවා ගිවිසුම් මත සේවයට බඳවාගත් බඳවාගන්නා ලද ආර්.එම්.එම්.ජේ.බණ්ඩාර මයා, එස්.සුදර්ශන් මයා, එස්.ඒ.අයි පුෂ්ප කුමාර මයා, ඒ.ජී.සී.ආර්.මල්ෂාන් මයා, ඒ.බී. නිලන්ත දුල්මිණ මයා, එල්.ආර්.කේ.සී.ආර්.විජේරත්න මයා, එම්.එම්.එන්.පී.ජයසිංහ මයා යන සෞඛ්‍ය කම්කරුවන්ගේ හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන්ගේ සේවා ගිවිසුම් කාලය ඉදිරි මාස 12 ක් සඳහා දීර්ඝ කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(vii).** සභාවට අයත් වෙලන්හින්න ජල යෝජනා ක්‍රමයේ ජල මෝටරය වරින් වර අක්‍රිය වීම හේතුවෙන් එම ජල යෝජනා ක්‍රමය මඟින් ජල සැපයුම් ලබා ගන්නා ලද ජල පාරිභෝගිකයන්ට 2022 වර්ෂයේ පෙබරවාරි මස සිට අඛණ්ඩ ජල සැපයුමක් ලබා නොදුන් බව දන්වමින්, එම කාලය සඳහා ස්ථාවර ජල ගාස්තු අය නොකරන ලෙසට වෙලන්හින්න ගම්වාසීන් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ජල සැපයුම් ලබා නොදුන් කාලය සඳහා ස්ථාවර ජල ගාස්තු අය නොකිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.
ඒ අනුව ජල සැපයුම් ලබා නොදුන් කාලය සඳහා ස්ථාවර ජල ගාස්තු අය නොකිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(viii).** බල ප්‍රදේශය තුල පිහිටි මාර්ග ජී.අයි.එස්. තාක්ෂණය භාවිත කර මැනුම් කටයුතු සිදුකර සිතියම්ගත කිරිමට අදාල කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බවත්, ඒ සඳහා දැනට සභාව සතුව පවතින ලැප්ටොප් වර්ගයේ පරිගණක යන්ත්‍ර ප්‍රාමණවත් නොවන බැවින්, පළාත් පාලන කොමසාරිස්තුමා දන්වා එවා ඇති පරිදි පහසුකම් සහිත (Capacity) I – 7 වර්ගයේ ලැප්ටොප් වර්ගයේ පරිගණක යන්ත්‍රයක් හෝ Desk Top

පරිගණකයක් මිලදී ගැනීමට අදාලව විෂය නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

ජී.අයි.එස්. තාක්ෂණය භාවිත කර මාර්ග සිතියම්ගත කිරීමේ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිළ ගණන් කැඳවීමෙන් අනතුරුව, පහසුකම් සහිත (Capacity) I – 7 වර්ගයේ ලැප්ටොප් වර්ගයේ පරිගණක යන්ත්‍රයක් හෝ Desk Top පරිගණකයක් මිළදී ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ජී.අයි.එස්. තාක්ෂණය භාවිත කර මාර්ග සිතියම්ගත කිරීමේ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිළ ගණන් කැඳවීමෙන් අනතුරුව, පහසුකම් සහිත (Capacity) I – 7 වර්ගයේ ලැප්ටොප් වර්ගයේ පරිගණක යන්ත්‍රයක් හෝ Desk Top පරිගණකයක් මිළදී ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ix). ඉඹුල්පේ ර/ ශාරිපුත්‍ර මහා විද්‍යාලය විසින් හිස් භූමියක් තුල ඖෂධ පැළෑටි සහ වෙනත් පැළ සිටුවීමේ රුක්පෝෂන වැඩසටහනක් සංවිධානය කර ක්‍රියාත්මක කිරීමට අදාලව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් ඉදිරිපත් කල ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
සභා අරමුදලේ පරිසර ගිණුමෙන් මේ සඳහා මුදල් යෙදවිය හැකි අතර මේ සඳහා ඇස්තමේන්තුවක් සකස් කිරීමටත්, මෙම රුක් රෝපණ වැඩසටහන ප්‍රාදේශීය සභාව හා සම්බන්ධ වී කරනු ලබන ප්‍රජා සත්කාරයක වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි.

ප්‍රාදේශීය සභාව හා සම්බන්ධ වී කරනු ලබන වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමටත් මේ සඳහා සභා අරමුදලින් පැළ වර්ග ලබා දිමට අවශ්‍ය කටයුතු සලසා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් යෝජනා කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව පැළ සිටුවීමේ වැඩසටහන සඳහා අවශ්‍ය පැළ වර්ග ලබා දීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කිරීමටත්, එම ඇස්තමේන්තුගත මුදල ප්‍රාදේශීය සභාවේ සභා අරමුදලේ පරිසර ගිණුමෙන් වියදම් දැරිමටත්, මෙම වැඩසටහන ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව හා එම විදුහල සම්බන්ධ වී කරනු ලබන වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

## (06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද ඔක්තෝම්බර් මස 01 වන දින සිට ඔක්තෝම්බර් මස 31 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 114 සහ වවුචර් අංක 812 සිට 939 දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ වවුචර් උපලේඛන 2022.11.03. වන දින පැවැති මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මුදල් කමිටුවේ අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

**(06). (ii).** ටෙන්ඩර් මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම.

**2022.11.03.** දින පැවැති ප්‍රසම්පාදන කමිටුව විසින්,

**01.** ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් කැඳවීම.

**02.** ප්‍රධාන කාර්යාලය සඳහා අවශය ලිපිගොණු තැබීමේ රාක්කයක් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

**03.** ප්‍රාදේශීය සභා පෙර පාසල සඳහා පෙර පාසල් ටී ෂර්ට් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

**04.** ප්‍රධාන කාර්යාලයේ පරිගණක සඳහා පරිගණක UPS මිලදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් කැඳවීම.

**05.** වෙලන්හින්න ජල යෝජනා ක්‍රමය සඳහා ලීටර් 5000 ජල ටැංකියක් මිලදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් කැඳවීම.

**06.** ප්‍රාදේශීය සභා ජල ව්‍යාපෘති සංවර්ධන වැඩ කටයුතු සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

**07.** ප්‍රධාන කාර්යාලයේ ඉන්ධන ගබඩා කිරීමේ ස්ථානයක් සැකසීම සඳහා ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

**08.** බල ප්‍රදේශයේ විථි පහන් නඩත්තු කටයුතු සඳහා අවශය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමට අදාල වූ ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභා අනුමැතිය සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(07).** ආදායම් වියදම් වාර්තාව.

**2022** ඔක්තෝම්බර් මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

**(08).** වෙනත් කරුණු.

**(i).** ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම්තුමියගේ ආදරණීය ස්වාමි පුරුෂයා අභාවප්‍රාප්ත වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ ශෝකය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කරගන්නා අතර කණගාටුව පල කර යැවීමට කටයුතු කරනවා.

**(ii).** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ දැනට සේවයේ නියුතු ආයුර්වේද වෛද්‍යවරිය මේ වසර අවසානයේ විශ්‍රාම යාමට නියමිත අතර, එතුමියගෙන් සභා බල ප්‍රදේශයට විශාල සේවයක් සිදු වූ බැවින්, මෙම ආයුර්වේද

බෙහෙත් ශාලාවට වෙනත් ආයුර්වේද වෛද්‍යවරියක් අනුයුක්ත කර නොමැතිනම්, ඒ පිළිබඳව විමසා බලා ඉදිරියටත් මෙම වෛද්‍යවරියම සේවයේ රඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සලසන ලෙස ඉල්ලා සිටිනවා.
මාරතැන්න, තෝරවෙලකන්ද, නෙල්ලිවල, ගුරුබැවිල, පිඩලිගන්නවෙල වැනි ප්‍රදේශ කිහිපයක් පින්නවල ප්‍රදේශය තුල ආවරණය වීම, කුඩා තේවතු හිමියන් විශාල පිරිසක් ජීවත් වීම නිසා ඔවුන්ට මුදල් ආපසු ලබා ගැනිමටත්, මුදල් තැන්පතු කටයුතු කඩිනමින් හා කාර්යක්ෂම සිදුකර ගැනීම සඳහාත්, පින්නවල නගරය තුල **(Automated Teller Machine)** ස්වයංක්‍රීය ටෙලර් මැෂින් යන්ත්‍රයක් ස්ථාපිත කර දෙන ලෙසට පසුගිය සභාවාරයක දී යෝජනාවක් ඉදිරිපත් කළා. එහෙත් එම යෝජනාව සම්බන්ධයෙන් අදාල ආයතන දැනුවත් කිරිමේ ලිපියේ පිටපතක් මා වෙත ලැබුණේ නැහැ. එබැවින් නැවත මහ බංකුව සහ බලංගොඩ ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති අනෙකුත් බැංකු ශාඛා දැනුවත් කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**(iii).** ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා අදහස් දක්වමින්,
ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර සුදුසු බඳුකරුවෙකුට බෙලිහුල්ඔය සංචාරක ගිමන්හල බඳු දී ඇතත්, එම ස්ථානය නිසියාකාරව පවත්වාගෙන යන බවක් දක්නට නොමැති අතර, රාත්‍රී කාලයේ දී මත්පැන්වලට අබ්බැහි වූවන් ගැවසෙන වාසස්ථානයක් බවට පත්ව එම ස්ථානය අවභාවිතා වෙමින් පවතින බවක් දක්නට ලැබේ. සභාවට අයවිය යුතු මුදල් අයකරගෙන තිබෙනවාද? බඳුගිවිසුම් කාලය දීර්ඝ කිරිමක් සිදු වුණාද? මෙහි වර්තමාන තත්ත්වය කුමක් ද? පැහැදිලි කිරීමක් සිදු කරන්න. සභාවට අයකරගත යුතු මුදල් නොගෙවන්නේ නම්, තැන්පත් කර ඇති ඇප තැන්පතුව මඟින් සභාවට අයවියයුතු මුදල් අයකර ගැනීමෙන් අනතුරුව, සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**(iv).** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමින්,
මද්දේගම, හා මාරතැන්න වසම් දෙක සඳහා එකම ග්‍රාමසේවා කාර්යාලයක් පිහිටුවා ඇත. මාරතැන්න වසමට අයත් ප්‍රදේශවාසීන් ග්‍රාම නිලධාරි මඟින් ඉටු කරවා ගතයුතු සේවාවන්හිදී පින්නවල පහළ මාර්ගයෙන් පැමිණ මද්දේගම වසමේ පිහිටුවා ඇති ග්‍රාම නිලධාරි කාර්යාලයට පිවිසිය යුතුය. ඔවුන් ප්‍රවාහන අපහසුතාවයට පත්වන අතර ඔවුන්ට යම්කිසි කාර්යයක් කරවා ගැනීමට දිනෙක කාලයක් ගතවේ. මෙමගින් ඔවුන් දැඩි ලෙස අපහසුතාවයට පත් වන බැවින්, ඒ සඳහා මාරතැන්න වසම තුල ගොඩනැගිල්ලක් පවතින බැවින්, එහි ග්‍රාමනිලධාරිතුමා එක් දිනක් යෙදවිමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ප්‍රාදේශීය ලේකම්තුමියටත්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවටත් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**(v).** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය අදහස් දක්වමින්,
සභා බල ප්‍රදේශයේ කීණගහඇල්ල මාර්ගයෙන් ආරම්භ වී රතුපස්පංගුව අසල සිට උඩවෙල මාර්ගය සම්බන්ධ වන ගම්සභා මාර්ගය ප්‍රදේශයේ පවුල් කිහිපයක් දෛනික අවශ්‍යතා සපුරාගැනීම සඳහා භාවිතා කරනු ලැබේ. මෙම මාර්ගයේ කි.මී. 1 ½ ක කොටසක් සභාව විසින් සංවර්ධනය කර තිබෙන අතර, තවත් ඉදිරියට කි.මී. 1 ½ ක කොටසක් අතිදුෂ්කර ලෙස සංවර්ධනය කල යුතුව පවතිනවා. එම මාර්ග කොටස කාණු පද්ධතිය සමඟ සංවර්ධනය කිරිමේ දී සභාවේ ජේ.සී.බී. යන්ත්‍රය ලබා දෙන ලෙසත්, ඒ සඳහා ඉන්ධන වෙනුවෙන් සභාවට වියදම් දැරීමට නොහැකිනම්, ගම්වාසීන් ඒ සඳහා ඉන්ධන ලබා දිමට කැමැත්ත පලකර අති බැවින් එක් දිනකට එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ජේ.සී.බී. යන්ත්‍රය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**(vi).** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
ණය මුදලක් ලබා ගැනීමෙන් අනතුරුව, පින්නවල නගරය සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කිරිමට නියමිත බව සඳහන් කළා. එහි වර්තමාන තත්ත්වය කෙසේ ද? ඒ පිළිබඳව දැනගැනීමට මා කැමතියි.

**(vii).** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
සභා බල ප්‍රදේශයට අයත් අලුත්නුවර හල්කඳුර මාර්ගය විකල්ප මාර්ගයක් ලෙස ප්‍රදේශවාසීන් භාවිතා කරනවා. අධික වර්ෂාවත් සමඟ ජලය බැසයාම සිදුවන්නේ එම මාර්ගය හරහා බැවින් එම මාර්ගය දැඩි ලෙස අබලන් වෙලා. මාර්ගයේ මීටර් පනහක් පමණ දුරකට ජලය අඩි 1 ½ පමණ පිරෙනවා. මේ හේතුවෙන් අසල ගෙවල්තුලටත් ජලය පිරෙනවා. වැලිකොට්ට මඟින් හෝ තාවකාලිකව පැතිබැම්මක් සකස් කිරිම සුදුසුයි.

**සංවර්ධන කටයුතු සඳහා රටතුල උද්ගත වී ඇති ආර්ථික අර්බුධකාරී තත්ත්වය ගැටළුවක් වුවත්, ටික දුරක් හෝ ආවරණය වන පරිදි පැති බැම්මක් ඉදි කිරිමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ඉල්ලා සිටිනවා.**

**(viii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,**
**සංවර්ධනය කිරිමට නියමිත නෙල්ලිවල ඇතුළු මාර්ගවල සංවර්ධන කටයුතු ලබන වසරේ දී අවසන් කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා. සංවර්ධනය කිරීමට නියමිත මාර්ගවල කාණු පද්ධතිය විධිමත් නොවීම හේතුවෙන් මාර්ග තුලින් ජලය බැසයාමක් සිදුවෙනවා. කාපට් කිරීමට නියමිත මාර්ග සංවර්ධනය කිරිම පිළිබඳව පළාත් සභාව දැනුවත් කිරිමට පියවර ගන්න.**

**(ix). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,**
**පඹගින්න, කිංචිගුණේ ධීවර ගම්මානයේ ප්‍රදේශවාසීන් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් ජල සම්බන්ධතා ලබා ගැනීම හේතුවෙන්, ප්‍රජා ජල ව්‍යාපෘතිය මගින් ජල සම්බන්ධතා ලබා ගැනීමේ දී භාවිතා කරන ලද ජිනසේන සමාගමට අයත් ජල මෝටර් දෙකක් පවතින බැවින්, එම ජල මොටර් දෙක සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.**
**සභාවට අයත් ගලගම හා පඹගින්න ජල යෝජනා ක්‍රමයන්හි ජල මනු කියවීම ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක කරමින්, එහි නඩත්තු කටයුතු නිසියාකාරයෙන් සිදු නොවන බැවින්, එම ජල යෝජනා ක්‍රමයන්හි නඩත්තු කටයුතු සඳහා වෙනත් අයෙකු යෙදවීමට හැකියාවක් ඇත්ද?**

**(x). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ජ් සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,**
**පින්නවල ජල යෝජනා ක්‍රමය මඟින් ආබාධිත පුද්ගලයෙකුට ජල සම්බන්ධතාවයක් නොමිලයේ ලබා දීම සඳහා පසුගිය සභාවාරයේ දී යෝජනාවක් ඉදිරිපත් කල අතර මහ සභාව විසින් ඒ සඳහා අනුමැතිය ලබා දුන්නා. එහෙත් එම ආබාධිත පුද්ගලයා ඒ මහතාගේ නෑදෑයෙක් සමඟ ජිවත්වීම සඳහා ගොස් ඇති බැවින්, එම ජල සම්බන්ධතාවය ලබා දීම සම්බන්ධයෙන් වැඩිදුරට තොරතුරු සොයාබලා ලබා දීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,**
**ආයුර්වේද වෛද්‍යවරිය රඳවා ගැනීමේ සේවා කාලය දීර්ඝ කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කළත්, රාජ්‍ය වියදම් පාලනය කිරිම සඳහා මුදල් අමාත්‍යාංශය ලේකම් විසින් රාජ්‍ය මුදල් පිරිමැසිමෙන් පරිහරණය කිරීමේ අවශයතාවය කෙරෙහි අවධානය යොමු කර ඇති බැවින්, වෛද්‍ය වෘත්තිය යන්නෙන් බටහිර වෛද්‍ය වෘත්තියත්, දේශීය ආයුර්වේද වෛද්‍ය වෘත්තිය ලෙස අර්ථකතනය වන බැවින්, නැවත සේවයේ රඳවා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලා ඉල්ලීම් කරන ලෙස ලේකම්තුමියට දැනුම් දුන්නා.**
**එමෙන්ම මෙම ආයුර්වේද වෛද්‍යවරිය විශ්‍රාම ගැන්වීමෙන් පසුව සභා ආයුර්වේද බෙහෙත් ශාලාව වසා තැබිය නොහැකි බැවින්, කඩිනමින් වෛද්‍යවරියක් යොදවන ලෙසට පළාත් සෞඛ්‍ය කොමසාරිස් වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වීම අනුව,**
**ග්‍රාමනිලධාරිතුමා රාජකාරියේ යෙදවීම සම්බන්ධයෙන් ඔබතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යොජනාව ලිඛිතව ලබා දෙන්න. එම ඉදිරිපත් කිරිම ප්‍රාදේශීය ලේකම්තුමියටත්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවටත් ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.**

**ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,**
**බෙලිහුල්ඔය සංචාරක ගිමන්හලේ බදුගිවිසුම්කරු විසින් මාසිකව සභාවට ගෙවිය යුතු මුදල් ගෙවීම් කටයුතු පැහැර හැර ඇති අතර, ඒ සම්බන්ධයෙන් සභාව විසින් වරින් වර දුරකතනය මඟින් විමසුම් කළාම මුදල් ගෙවන බව ප්‍රකාශ කළා. එහෙත් ප්‍රාදේශීය සභාව රජයේ පිළිගත් ආයතනයක් බැවින්, ගිවිසුම් ප්‍රකාරව මුදල්**

අය කර ගතයුතුයි. මෙම ස්ථානය සභාව සතු දේපලක් බැවින්, අදාල මුදල් ගෙවන ලෙස, දැනුම් දීමටත්, එසේ නොගෙවන්නේනම් දින 14 ක් ඇතුළත එම ආයතනය නැවත සභාවට භාර දෙන ලෙස දැනුම් දීමටත්, එසේ භාර නොදෙන්නේනම් ශ්‍රී ලංකා පොලිසියට පැමිණිල්ලක් ඉදරිපත් කිරීමෙන් අනතුරුව, සභාව සතු දේපල සභාවට පවරාගෙන වෙනත් ටෙන්ඩර් කරුවෙක් වෙත නිත්‍යානුකූල ආකාරයට ලබා දීම සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා කටයුතු කරනවා. මාස 03 කට ඇප තැන්පතු වශයෙන් මුදල් තැන්පත් කර ඇත.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය අදහස් දක්වීම අනුව,
රට තුල උද්ගතව ඇති ආර්ථික අර්බුධය හා ඉන්ධන අර්බුධකාරී තත්ත්වය ගැටළුවකි. එම මාර්ගය සංවර්ධනය කිරීමට ගම්වාසීන් ඉන්ධන සපයන්නේනම් ජේ.සී.බී. යන්ත්‍රය ලබා දීමට අවශ්‍ය පියවර ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දැක්වීම අනුව,
කොරෝනා වසංගත තත්ත්වයත්, දේශපාලන හා ආර්ථික අස්ථාවරභාවය හේතුවෙන් පින්නවල කුඩා නගරය සංවර්ධනය කිරීමේ කටයුතු වල ප්‍රමාදයක් සිදුවුණා. එහෙත් ඒ සම්න්ධයෙන් මේ මස 17 වෙනිදා උපදේශන කමිටුවක් පැවැත්වීමට නියමිත බැවින් ඒ සඳහා සහභාගී වන ලෙසට පින්නවල මාර්ගය මාර්ගයේ රැඳී සිටින සියලු මන්ත්‍රීවරුන්ට දැනුම් දීමටත්, ඒ සඳහා උනන්දුවක් හා කැමැත්තක් දක්වන අනෙකුත් මන්ත්‍රීවරුන්ට ඉල්ලීම පරිදි දැනුම් දීමටත් කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දැක්වීම අනුව,
ප්‍රධාන ගම් ප්‍රදේශ දෙකක් යාවෙන මාර්ගයක් බැවින්, සංවර්ධනය විය යුතුම මාර්ගයකි. එබැවින් එම මාර්ගය සංවර්ධනය කිරීම පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙස පළාත් මාර්ග අමාත්‍යාංශය වෙතත්, ගරු ආණ්ඩුකාරතුමා වෙතත් දන්වා යැවීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දැක්වීම අනුව,
පඹහින්න, කිංචිගුණේ ධීවර ගම්මානයේ ප්‍රජා ජල ව්‍යාපෘතිය මගින් ජල සම්බන්ධතා ලබා ගැනීමේ දී භාවිතා කරන ලද ජිනසේන සමාගමට අයත් ජල මෝටර් දෙක සභාවට පවරා ගැනීම සඳහා ඔවුන්ගේ දැනුවත් කිරීම මත සභාව විසින් ඉල්ලීමක් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දැක්වීම අනුව,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස මා වෙත ලැබුණු තොරතුරු මත නොමිලයේ ලබා දීමට නියමිත ජල සම්බන්ධතාවය ලබා දීම තාවකාලිකව නැවැත්වීමට කටයුතු කළා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
ඔබතුමා මෙන්ම මාද ජීවිත කාලය පුරාම දන්නා මාර්ගයක් වන අතර මේ ප්‍රදේශය අවට සිටින එක් කණ්ඩායමක් විසින් ඉවුර කපා දැමීමත්, අනෙක් කණ්ඩායම කාණුව කපා දැමීමත් මෙම ගැටළුවට හේතුවක්. මේ පිළිබඳව මා වෙත පැමිණිල්ලක් ගම්වාසීන් ඉදිරිපත් කළා. ඒ පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා කාර්මික නිලධාරි මහතා යොමු කළා. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත් වීමෙන් මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීමත් සමඟ යම් දුරකට පැතිබැම්මක් ඉදිකර තිබෙනවා. වැලිකොට්ට දැමීමෙන් අනවශ්‍ය පිරිවැයක් දැරීමට සිදුවේ. රටේ වත්මන් තත්ත්වය සමඟ සංවර්ධන කටයුතු ප්‍රතිපාදන වෙන් කරදීම ගැටළු සහගත බැවින් තාවකාලික විසඳුමක් ලෙස සභාවට අයත් ජේ.සී.බී. යන්ත්‍රය මඟින් කාණුව පාදා ජලය බැස යාමට අවශ්‍ය කටයුතු සලසනවා.

## (09). මී ළඟ සභා වාරයට දින නියම කිරීම.

ඊළඟ සභා වාරය දෙසැම්බර් මස 13 වන අඟහරුවාදා දින පැවැත්වීමට කටයුතු කරනවා.

## (10). ස්තූති කතාව හා අවසානය.

**හත්වන සභාවේ පනස් හත්වන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, ලේකම්තුමිය අසනිප තත්ත්වයේ පසුවන බැවින් එතුමිය නියෝජනය කිරීම සඳහා සහභාගී වූ ප්‍රධාන කළමනාකරණ සහකාර එම්.එල්.ටී.කේ. ලක්ෂිත තරිඳු මහතා, විෂය නිලධාරිනිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි.**

**ඉන් අනතුරුව, පෙ.ව. 11.40 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.**

**එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,**
**සභාපති,**
**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.**